
පුංචි අමායා

"අමායාගේ කතාව" නිෂ්පාදනය කරන ලද්දේ යුරෝපා සංගමය විසින් අරමුදල් සපයන, UNDP සහ UNICEF Sri Lanka මගින් ක්‍රියාවට නැංවෙන, අධිකරණ අමාත්‍යාංශය විසින් පහසුකම් සලසන, '"යුක්තිය සඳහා සහාය ව්‍යාපෘතිය (JURE) යටතේය. මෙම පොතෙහි ඉදිරිපත් කරන එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ (UNCRC) දැක්වෙන වගන්ති, ඒවායේ නිරවද්‍යභාවයට අවධානය දෙමින් මුල් අදහස සුරැකීමේ අරමුණ ඇතිව ඉතා ප්‍රවේශමෙන් පරිවර්තනය කර ඇත. අවශ්‍ය තැන්වලදී එම වගන්ති වඩා පැහැදිලිව තේරුම් ගැනීමේ පහසුව සහ කියවන්නාට ළමා අයිතිවාසිකම් වඩා සමීප කරවීමේ අදහස ඇතිව ඒවා සන්දර්භගත කර ඇත. මෙහිදී මුල් සම්මුතියෙහි අදහස් ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කිරීමට හැකි සෑම උත්සාහයක්ම ගෙන ඇත. මෙම පරිවර්තන සහ පැහැදිලි කිරීම් අධ්‍යාපනික හෝ දැනුවත් කිරීමේ කාර්යයන් සඳහා පමණක් යොදාගත යුතු අතර UNCRC හි නිල නෛතික අර්ථදැක්වීම් ලෙස නොසැලකිය යුතුය.

# පුංචි අමායා



මේ පොතේ තියෙන ළමා අයිතිවාසිකම් දෙමව්පියන් වගේම දරුවන් සමඟ වැඩ කරන, දරුවන් තම භාරකාරත්වයේ ඉන්න, ඕනෑම වැඩිහිටියෙක්, කියවන්න, තේරුම්ගන්න. ඒ වගේම ඒවා ළමයින්ට කියලා දෙන්න.

මේ ඉන්නේ පුංචි අමායා.
ඔන්න දවසක් එයා වත්ත පහළට ඇවිදගෙන ගියා.
වත්ත පහළ පුංචි දොළපාර ළඟ සෙල්ලං කරන්න අමායා හරි ආසයි.
හුරතලේට ඇති කරන එයාගේ පුස් පැටියා සුසීයි, බලු පැටියා ලුවීයි
දෙන්නම මේ වෙලාවට ඉන්නෙත් එතන.

''සුසී..'' අමායා කතා කළා.





''ඇයි, ඇයි? මං මෙතන''

ඒ සද්දෙට පුංචි අමායා ගැස්සුනා. සුසී කතා කළාද? කවදා
සුසී පුංචි අමායා එක්ක කතා කරලා නෑ. ඤාව් ගානවා විත

''ඔව් මට කතා කරන්න පුළුවන්. කතා කරන එක මගේ අයි
සුසී පුංචි අමායාට කිව්වා.

''අයිතියක්! මොකද්ද ඒ? ඔයාට මොකටද එහෙම අයිතියක්?''

''මගේ ආරක්ෂාවට. මගේ යහපතට. ඒකටනෙ
කෙනෙකුට අයිතිවාසිකම් තියෙන්නේ.'' සුසී කිව්වා.

පුංචි අමායාට හරි පුදුමයි. සුසී කතා කරනවා
විතරක් නෙමෙයි...

එයා දන්න දේවලී...

''ඔයා දන්නවද පුංචි අමායා, ඔයා ළමයෙක්.''

''ළමයෙක්?'' අමායා පුදුමයෙන් ඇහුවා

''ඔව් අවුරුදු දහ අටට අඩු නං ඔයා ළමයෙක්.
ළමයෙකුගේ ආරක්ෂාවට තියෙනවා
ළමා අයිතිවාසිකම්.''

''ආ.. මටත් එහෙම ඒවා
තියෙනවද?''

සුසීගේ කතාව ඇහුවම අමායාට හරි සතුටුයි.
ඉතින් අමායා සිංදු කියන්න ගත්තා.





සුසී සුසී මට කියන්නකෝ
මගේ රයිට්ස් මට කියන්නකෝ
ආරක්ෂාවට ඕනමදෝ
ඉක්මන් කරලා කියන්නකෝ



සුසීත් සින්දුවෙන්ම උත්තර දෙන්න ගත්තා...

ඔයා කැමති දේ ඉගෙන ගන්න
සතුටෙන් පවුලත් එක්ක ඉන්න
කරදර හිරිහැර නැතුව ඉන්න
පරිස්සමට ලොකුමහත් වෙන්න

ඔයාට අයිතිය තියෙනවා
අමායා දැන් දැනගන්නවා

පුංචි අමායා සුසී එක්ක සිංදු කියනවා දැකලා ලුවී එතනට දුවගෙන ආවා.

"ආ පුංචි අමායා."

ලුවී කතා කරනවා දැක්කම පුංචි අමායා හොඳටම ගැස්සුනා.

"ඔයාටත් පුළුවන්ද..?"

"ඔව්.. අපි හැමෝම කතා කරනවා. පුංචි අයට විතරක් ඇහෙන්න.
ඉතින් මාත් ඔයත් එක්ක සිංදු කියන්නද?" ලුවී ඇහුවා.



"ඔයත් මාත් එක්ක කතා කලෙත් නෑනේ.
ඒ හින්ද මං ඔයාව සිංදු කියන්න ගන්නේ නෑ.."

"ආ.. එහෙම කරන්න බෑ...
සමාන ලෙස සැලකුම් ලබන්න හැම
ළමයෙකුටම අයිතියක් තියෙනවනේ.."

"මෙන්න මෙයත් දන්නවා රයිට්ස්??"
අමායා පුදුමයෙන් කිව්වා.





''ලුවී ලුවී මට කියන්නකෝ
මගේ රයිට්ස් මට කියන්නකෝ
ලුවී ඔයා මට ආදරේ නං
දැනුවත් කරලා තියන්නකෝ''



ලුවිත් සිංදුවෙන්ම උත්තර දෙන්න ගත්තා.

''අදහස් දරන්න ඒවා කියන්න
දේවල් හිතන්න තොරතුරු හොයන්න
නරක දෙයින් ඈතට වෙන්න
මව්පිය රැකවරණය ලබන්න

ඔයාට අයිතිය තියෙනවා
අමායා දැන් දැනගන්නවා''

ඔන්න එතකොටම එතනට ආවා වත්තට
හැමදාම එන පාට පාට සමනලයා.

"මෙයත් කතා කරනවද?"
එනකොටම පුංචි අමායා ඇහුවා.

"මගේ නම රෝසි. අපි හැමෝම කතා කරන්න
හැබැයි ඇහෙන්නේ ළමයින්ට විතරයි."



"කන්න බොන්න ලොකු වෙන්න
සතුටෙන් සෙල්ලම් කරන්න
නිදහස විඳිමින් හැදෙන්න
සැහැල්ලුවෙන් තටු සලන්න


ඔයාට අයිතිය තියෙනවා
අමායා දැන් දැනගන්නවා"





පුංචි අමායාට  හරි පුදුමයි. මේක හීනයක්ද කියලත් සැකයි.
ඒක හින්දා එයාට දැන් ඕන ඉක්මනට ගෙදර ගිහින් අම්මට මේ ගැන කියන්න.

''මං දැන් ගෙදර යන්න ඕනි. අම්මට මේ අයිතිවාසිකම් ගැන කියන්න ඕනි.''



එයා ගෙදර පැත්තට දුවගෙන ගියා.
ඒ පස්සෙන් සුසීයි  ලුවීයි රෝසියි
තුන්දෙනත් එයා එක්ක ගේ ළඟටම ගියා.


පුංචි අමායා කෙළින්ම දුවගෙන ගියේ අම්මා ළඟට. අම්මා හිටියේ කුස්සියේ කෑම උයන ගමන්.
''අම්මා! අම්මා! මට රයිට්ස් තියෙනවද?''


''ඔව්! මගේ දුවට විතරක් නෙමෙයි, හැම ළමයෙකුටම රයිට්ස් එහෙම නැත්තං අයිතිවාසිකම් තියෙනවා. ඒවා තියෙන්නේ පුංචි ළමයින්ගේ ආරක්ෂාවටයි, හොඳ පුරවැසියෙක් විදිහට ලොකු වෙන්නයි.'' අම්මා කිව්වා.


''අම්මා මං කොහොමද ඒ අයිතිවාසිකම් දැනගන්නේ? මට කියලා දෙන්නකෝ...''
''අපි සෙල්ලමක් කරමු. මං එක එක තැන්වල
ඔයාගේ රයිට්ස් ලියලා හංගලා තියෙනවා.
ඒවා හොයාගෙන දැනගත්තොත් කතන්දර පොතක් තෑගි  දෙනවා.''


පුංචි අමායා  හරි ආසයි සෙල්ලම් කරන්න.
ඒ වගේම එයා ආසයි
කතන්දර පොත් කියවන්නත්.
ඒ හින්දා  එයා
සුසීයි ලුවීයි රෝසියි එක්ක
රයිට්ස් එකතු කරන්න ගත්තා.

මල් වාස් එක යට මෙහෙම පණිවිඩයක් තිබු




පොත් මේසේ උඩ තවත් right එකක්.





''ඔයා කැමති දෙයක් ඉගෙන ගන්න,
ඒ ඉගෙනගන්න දෙයින් ඔයාගේ හැකියාවන්
වැඩිදියුණු කරගන්න ඔයාට අයිතිය තියෙනවා
කියලයි මේ කියන්නේ,''

ලුවී අමායාට කියලා දුන්නා.


## ඇඳුම් අල්මාරියේ තවත් එකක්.




''ඔයා බය නැතුව ඔයාට හිතෙන දේ කියන්න ඕනි අමායා..
ඒකට ඔයාට නිදහස තියෙනවා, හැබැයි ඒක කාටවත් හානියක් වෙන්න හොඳ නෑ.'' සුසී කිව්වා.


පාට පැන්සල් පෙට්ටියෙත්..
හිංසාවෙන් ආරක්ෂා වීම ළමයින්ගේ අයිතියක්
''ළමයින්ට කරදර හිරිහැර කරන්න කාටවත් අයිතියක් නෑ ඔන්න,'' රෝසි තදින් කිව්වා.
COLORING

දාස්පෙතියා මල් පාත්තියේ මෙහෙම එකක් ති




''ඒගොල්ලොත් අපි වගේම නිදහසේ,
තමුන්ට කැමති දේ ඉගෙනගෙන,
කැමති විදිහට ඉන්න ඕනේ.
එහෙම ඒ අයට ඉන්න අපි උදව් කරන්න ඕනේ.''

ා. තැපැල් පෙට්ටිය ඇතුළෙත්.




''ඔන්න එතකොට අම්මා ඇවිත්
පුංචි අමායාව ආදරෙන් තුරුල් කරගත්තා.
දැන් ඔයා ළමයින්ගේ අයිතිවාසිකම් ගොඩක් දන්නවනේ.
ඒවා ඔයා දැනගන්න ඕනි ඔයාගේ ආරක්ෂාවට.
ළමයින්ට තවත් අයිතිවාසිකම් තියෙනවා.
ඒවත් ඔයා දැනගන්න ඕනි,''
අම්මා ආදරෙන් අමායාට කිව්වා.
''මං අනිත් අයටත් කියලා දෙන්න ඕනි!''
''හා, හා ඔන්න තව දෙයක් දැනගන්න තියෙනවා
අම්මා අමායාව නතර කළා.
ඔයාට අයිතිවාසිකම් තියෙනවා වගේම,
අනිත් අයටත් අයිතිවාසිකම් තියෙනවා.''
අම්මා කියලා දුන්නා.


ආ? අමායා කල්පනා කරන්න ගත්තා.
ලූවී - ''ඔව් අමායා. ඒ නිසා අනිත් අයට ආදරය ගෞරවය දෙන්න..''
රෝසි- ''ඔයාට වෙන්න පුළුවන් හොඳම කෙනා වෙන්න..'' රෝසිත් කියලා දුන්නා.
සුසී - ''අනිත් අයට ඇහුම්කන් දෙන්නත් පුරුදු වෙන්න. හැබැයි ඒ අහන දේවල්වලින් ගන්න ඕන ඔයාගේ යහපතට හොඳම දේ විතරයි.'' සුසී අමායාගේ කනට ළංවෙලාම කිව්වා.
ඔයාගේ රයිට්ස් හොඳට දැනගෙන ඉන්නවා වගේම අනිත් අයගේ අයිතිවාසිකමුත් රැකෙන විදිහට වැඩ කළාම තමයි ඔයා හොඳම අමායා වෙන්නේ



අම්මා අමායාට කතන්දර පොත තෑගි දුන්නා.
අමායාට හරි සතුටුයි.

ඉතිං අමායා මේ කතන්දර පොත පුංචි ඔයාලා හැමෝමත්
එක්කත් බෙදාගන්න හිතාගත්තා.
මේ ඔයා කියවන්නේ අන්න ඒ පොත තමයි.



# ඔයගොල්ලන්ට තියෙන මේ අයිතීන් ගැන දන්නවා ද?

## 01 ළමයෙක් කියන්නේ කවුද?

වයස 18ට අඩු ඕනම කෙනෙක් ළමයෙක්.

## 02 සමානව සැලකුම් ලැබීම.

මේ කියන්නේ ඕනෑම ළමයෙක් -
එයා කවුරු වුණත්;
කොහේ ජීවත් වුණත්;
මොන භාෂාවක් කතා කළත්;
අදහන ආගම මොකක් වුණත්;
හිතන විදිහ මොකක් වුණත්,
පිටත පෙනුම කොහොම වුණත්;
පිරිමි ළමයෙක් වුණත්, ගැහැණු ළමයෙක් වුණත්;
ආබාධයක් ඇති දරුවෙක් වුණත්;
දුප්පත් වුණත් පොහොසත් වුණත්, දෙමාපියන්/ පවුල කවුරු වුණත්;
දෙමාපියන් හෝ පවුලේ අය කුමන දෙයක් විශ්වාස කළත්, කුමන දෙයක් සිදු කළත්;
කිසිම හේතුවක් නිසා වෙනස් විදිහට සලකන්න බෑ.



## 03 යහපතට මුල්තැන

ලොකු අය, ඔයා ගැන වගේම අනිත් ඕනෙම ළමයෙක් ගැන තීරණ ගන්නකොට, ඒවා ඔයාලට බලපාන්නේ කොහොමද කියන දේ ගැන හිතන්න ඕනේ. ඔයාලගේ උපරිම යහපත වෙනුවෙන් වැඩ කරන්න ඕනේ.
දරුවන් තමන්ගේ දෙමාපියන් හෝ ඔවුන් නැතිනම්, වෙනත් වගකිවයුතු වැඩිහිටියෙක් විසින් රැක බලාගන්නා බවට සෑම රටකම රජය සහතික වෙන්න ඕනේ. .
ඒ වගේම අම්මා තාත්තා වෙනුවට දරුවන් බලාගන්නා තැන් / තම නිවසින් බැහැරව දරුවන් රඳවා ගන්නා තැන් - උදා: පාසල්, රෝහල්, ළමා නිවාස, දිවා සුරැකුම් මධ්‍යස්ථාන [daycare] ඒ දරුවන්ව යහපත්ව, හොඳින්, ආරක්ෂිතව බලාගන්නවද කියලා සෑම විටම හොයලා බලන්න ඕනේ .

## 04 අයිතිවාසිකම් ළමයින්ට සැබෑවක් බවට පත් කිරීම

සෑම රටකම, සෑම ළමයෙකුටම තියෙන සෑම අයිතිවාසිකමක්ම ඔවුන්ට විඳින්න පුළුවන් කියන සහතිකය ලබාදෙන්න කටයුතු කරන්න රජයට වගකීමක් තියෙනවා.

## 05 පවුලේ මඟ පෙන්වීම

රජයන්, පවුල්වලට සහ ප්‍රජාවන්ට තම ළමයින්ට මඟ පෙන්වීමට ඉඩ දෙන්න ඕනේ. මේ තුළින් ළමයි ලොකු වෙනකොට ඒගොල්ලන්ගේ අයිතීන් හොඳට පාවිච්චි කරන්න ඉගෙන ගන්නවා. එතකොට, ළමයි ලොකු වෙන්න වෙන්න, ඔවුන්ට අවශ්‍ය මඟ පෙන්වීම අඩු වෙනවා.

## 06 ජීවත්වීම, පැවැත්ම සහ සංවර්ධනය

හැම ළමයෙකුටම ජීවත් වෙන්න අයිතියක් තියෙනවා. ළමයින්ට හොඳින් ජීවත් වෙන්න අවශ්‍ය රටක්, පරිසරයක් හැදීම සෑම රජයකම වගකීමක්.

## 07 නම සහ ජාතිකත්වය

ළමයෙක් ඉපදුනු වහාම ලියාපදිංචි කරන්න ඕනේ. ඒ වගේම රජය නිල වශයෙන් පිළිගත් නමක් ඒ ළමයාට දෙන්න ඕනේ. ළමයින්ට ජාතිකත්වයක් (රටකට අයත්) තියෙන්න ඕනේ.
හැකි සෑම විටම දරුවන් තම දෙමාපියන් ගැන තොරතුරු දැන සිටිය යුතු අතර ඔවුන්ගේ රැකවරණය ලබන්න ඕනේ.

## 8 අනන්‍යතාවය

ළමයින්ට තමන්ගේම අනන්‍යතාවයකට හිමිකම් තියෙනවා. නම, ජාතිකත්වය හා පවුල් සබඳතා ඇතුළත් ලියවිල්ලක් (උදා: උප්පැන්න සහතිකයක්) හැම ළමයෙකුටම තියෙන්න ඕනේ. මේක කිසිම ළමයෙකුට නැති කරන්න කාටවත් බෑ. එහෙම වුණොත්, සෑම රජයක්ම ඉක්මනින් ළමයාට ඒක නැවත ලබාගන්න උදව් කරන්න ඕනේ.

## 9 පවුල සමඟ සිටීමට ඇති අයිතිය

ළමයාගේ ආරක්ෂාවට හානියක් නැත්නම්, දෙමව්පියන්ගෙන් දරුවන් වෙන් නොකළ යුතුයි. උදා:දෙමාපියෙක් ළමයෙකුට හිංසා කළොත් හෝ රැකබලා ගත්තේ නැත්නම්,
දෙමාපියන්ගෙන් එක් කෙනෙක් සමග විතරක් ජීවත් වෙන ළමයෙකුට, එයාගේ ආරක්ෂාවට බාධාවක් නැත්නම්, තමා සමග ජීවත් නොවන මව හෝ පියා සමඟ සම්බන්ධතා පවත්වන්න අයිතිය තියෙනවා.

## 10 වෙනත් රටක සිටින දෙමාපියන් සමග



සම්බන්ධතා පැවැත්වීම

ළමයෙක් තමන්ගේ අම්මා හෝ තාත්තා සිටින රටේ ජීවත් වන්නේ නැතිනම්, ඒ ළමයාගේ අම්මා, තාත්තා හෝ දෙමාපියන් වෙත යාමට, සම්බන්ධතා පැවැත්වීමට අයිතියක් තියෙනවා.

## 11 පැහැරගැනීම්වලින් ආරක්ෂාව

නීතියෙන් අවසර නොගෙන, ළමයෙක් ජීවත් වෙන රටින් පිටතට ගෙන යාම රජය විසින් අවශ්‍ය පියවර ගෙන, නතර කළ යුතුයි.
උදා: දෙමව්පියන් වෙන්ව ජීවත් වන්නේ නම්, එක් අයෙකුගේ අවසරය නොමැතිව අනෙක් මව හෝ පියා විසින් දරුවා රටින් පිට කිරීම හෝ වෙනත් රටක රඳවා ගෙන තැබීම නොකළ යුතුයි.

## 12 ළමයින්ගේ අදහස්වලට ගරු කිරීම

තමන්ට බලපාන දේවල් සම්බන්ධයෙන් තමන්ට හිතෙන දේ නිදහසේ කියන්න දරුවෙකුට අයිතියක් තියෙනවා. වැඩිහිටියෝ මේ අදහස්වලට ඇහුම්කන් දෙන්න අවශ්‍යයි වගේම ඒවා සැලකිල්ලට ගන්න ඕනේ.

## 13 නිදහසේ අදහස් බෙදා ගැනීම

වෙන කෙනෙකුට හිරිහැරයක් නොවෙන්න, ඇඳලා, ලියලා, තව කෙනෙක්ට කියලා හෝ වෙන ඕනෙම විදිහකට ළමයින්ට ඒගොල්ලන්ගේ අදහස් කියන්න අයිතිය තියෙනවා.

## 14 සිතීමේ සහ ආගමක් ඇදහීමේ නිදහස

තමන්ට කැමති ආගමක් - අනිත් කෙනෙකුගේ අයිතීන්වලට හානියක් නොවන විදිහට - කැමති විදිහට අදහන්න ළමයින්ට අයිතියක් තියෙනවා. මේ ගැන ළමයින්ට මග පෙන්වන එක දෙමව්පියන්ගේ වගකීමක්. ඒ තුළින් මේ අයිතිය නිවැරදිව පාවිච්චි කරන්න ළමයින් ඉගෙන ගන්නවා.

## 15 කණ්ඩායම් පිහිටුවීම හෝ සම්බන්ධ වීම

අනිත් අයට හානි නොවන විදිහට, ළමයින්ට කණ්ඩායම් හෝ සංවිධානවලට සම්බන්ධ වෙන්න, එවැනි කණ්ඩායම් ඇති කරගන්න අයිතියක් තියෙනවා.

## 16 පුද්ගලිකත්වය ආරක්ෂා කිරීම

සෑම ළමයෙක්ටම පුද්ගලිකත්වයට අයිතියක් තියෙනවා. රටක නීතිය, ළමයින්ට මේ පුද්ගලිකත්වයට ඇති අයිතිය තහවුරු කරන්න ඕනේ. උදා : ළමයෙකුට යම් කරදරයක් වුණොත්, ඒක ප්‍රවෘත්තිවල වාර්තා කරනකොට ළමයාගේ සහ එයාගේ පවුලේ පුද්ගලිකත්වයට හානි නොවන විදිහට වාර්තා කරන්න ඕනේ.

## 17 තොරතුරු ලබා ගැනීමේ අයිතිය

ළමයින්ට, අන්තර්ජාලය, ගුවන්විදුලිය, රූපවාහිනිය, පුවත්පත්, පොත් සහ වෙනත් ඕනෑම මාර්ගයකින් තොරතුරු ලබා ගන්න අයිතියක් තියෙනවා. ඒත් ළමයි ඒ ලබාගන්න තොරතුරු හානිකර නොවන ඒවා බවට වගබලා ගන්න වැඩිහිටියන්ට වගකීමක් තියෙනවා.
මාධ්‍යය,ළමයින්ට තේරෙන විධිවලින්, ළමයින්ගේ යහපතට අවශ්‍ය තොරතුරු බෙදා හරින්න ඕනේ. ඒ වගේම රජයට වගකීමක් තියෙනවා මේ සඳහා මාධ්‍යය දිරිමත් කරන්න.

## 18 දෙමාපියන්ගේ වගකීම

දරුවෙක් යහපත්ව ලොකු මහත් කරන එක දෙමව්පියන් දෙදෙනාගේම වගකීමක්. දෙමාපියන්



නොමැති විට එම වගකීම, වගකිවයුතු වැඩිහිටියෙක්, එහෙම නැත්නම්, භාරකාරයෙක් වෙත පැවරෙනවා. දෙමාපියන් සහ භාරකරුවන් සෑම විටම ළමයාගේ උපරිම යහපත සලකා බලන්න ඕනේ. ඒ සඳහා රජයන් ඔවුන්ට උපකාර කරන්න ඕනේ. ළමයෙකුට දෙමාපියන් දෙදෙනාම ඉන්නවානම්, ඒ ළමයා ගැන ගන්නා සියලු තීරණ සම්බන්ධයෙන් ඔවුන් දෙදෙනාම වගකියන්න ඕනේ.

## 19 හිංසනයෙන් ආරක්ෂා වීම

රජය විසින් දරුවන් හිංසනයෙන්, අපයෝජනයෙන් හා ඔවුන් රැකබලා ගන්නා කෙනෙක් විසින් නොසලකා හැරීමෙන් ආරක්ෂා කරන්න ඕනේ.

## 20 පවුලක් නොමැති ළමයින්

තම පවුලේ ආරක්ෂාව නැති ඕනෑම ළමයෙකුට, එයාගේ ආගම, සංස්කෘතිය, භාෂාව සහ ජීවිතයේ අනෙකුත් අංශවලට ගරු කරන පුද්ගලයින් සමීපයේ ආරක්ෂාව ලැබීමට, හැදී වැඩීමට අයිතියක් තියෙනවා.

## 21 හදාගත් ළමයින්

ළමයින් හදා ගැනීමට ගන්නා විට [adoption] වැදගත්ම දෙය වන්නේ ළමයාගේ උපරිම යහපතයි. උදා: ළමයා සිටින රටේ ආරක්ෂිතව රැකබලා ගන්න බැරි නම් වෙනත් රටක පවුලකට ඒ ළමයා හදා වඩා ගන්න පුළුවන්.

## 22 සරණාගත දරුවන්

තම රටින් වෙනත් රටකට සරණාගතයින් ලෙස පැමිණෙන ළමයින්ට අවශ්‍ය උපකාර සහ ආරක්ෂාව ලබා දිය යුතු අතර, එම රටේ ළමයින්ට හා සමාන අයිතිවාසිකම් තියෙනවා

## 23: ආබාධ සහිත දරුවන්

ආබාධ සහිත සෑම ළමයෙකුටම සමාජය තුළ අනිත් සෑම ළමයෙක් ලෙසම, ජීවිතය හොඳම ආකාරයෙන් ගත කිරීමට දෙන්න ඕනේ. ඔවුන්ට ස්වාධීනව, තම සමාජය තුළ ක්‍රියාකාරීව සිටීමට ඇති බාධාවන් රජයන් ඉවත් කළ යුතුය.

## 24 සෞඛ්‍යය, ජලය, ආහාර, පරිසරය

ලබන්න පුළුවන් හොඳම සෞඛ්‍යය පහසුකම් ලබන්න, බොන්න පිරිසිදු වතුර, ගුණදායක කෑම සහ ජීවත් වෙන්න පිරිසිදු හා ආරක්ෂාව තියෙන පරිසරයක් ලබන්න ළමයින්ට අයිතියක් තියෙනවා. එහෙම යහපත්ව, සෞඛ්‍ය සම්පන්නව ඉන්න පුළුවන් කොහොමද කියන එක ගැන විස්තර සෑම ළමයෙකුටම සහ වැඩිහිටියෙකුටම පහසුවෙන් ලබාගන්න පුළුවන් වෙන්න ඕනේ.

## 25 ළමයෙකු ආයතනගත කර සිටිනකොට, ඒ ගැන නැවත සලකා බැලීම

නිවසින් බැහැර ස්ථානයක රඳවා ඇති සෑම ළමයෙකුගේම රැකවරණය, ආරක්ෂාව හා සෞඛ්‍යය ගැන, සියල්ල හොඳින් සිදුවන්නේද සහ ළමයාට හොඳම ස්ථානය එතැනද යන්න බැලීමට, ඔවුන්ගේ තත්ත්වය නිරතුරුව පරීක්ෂා කරන්න ඕනේ.

## 26 සමාජීය සහ ආර්ථිකමය උපකාර

දුප්පත් පවුල්වල දරුවන්ට උපකාර කිරීම සඳහා රජයන් මුදල් හෝ වෙනත් ආධාර ලබා දෙන්න ඕනේ.

## 27 ආහාර, ඇඳුම් සහ ආරක්ෂිත නිවසක්

ළමයින්ට ඇඳුම් පැළඳුම් සහ ජීවත්වෙන්න ආරක්ෂිත තැනක් තියෙන්න ඕනේ. මේ පහසුකම් නොමැති/ ලබාදෙන්න බැරි පවුල්වල දරුවන්ට



රජය උපකාර කරන්න ඕනේ.

## 28 අධ්‍යාපනයට තියෙන අයිතිය

සෑම ළමයෙක්ටම අධ්‍යාපනය ලබන්න අයිතිය තියෙනවා (වයස 16 දක්වා අනිවාර්යය අධ්‍යාපනය). ප්‍රාථමික අධ්‍යාපනය නොමිලේ විය යුතුයි. ද්විතීයික සහ උසස් අධ්‍යාපනය දක්වාද අධ්‍යාපනය ලැබීමට සෑම ළමයෙකුටම අවස්ථාව තියෙන්න ඕනේ (ශ්‍රී ලංකාවේ රජයේ පාසල් අධ්‍යාපනය, ප්‍රාථමික අවධියේ සිට ද්විතීයික, ජ්‍යෙෂ්ඨ අවධිය තෙක් නොමිලේ ලබා දෙයි). පාසල් යා හැකි උපරිම කාලය දක්වා යාමට ළමයින් උනන්දු කරන්න ඕනේ. පාසලේදී ළමයින් හික්මවන කොට ළමා අයිතීන්වලට ගරු කරන්න ඕනේ වගේම, හිංසනය පාවිච්චි නොකළ යුතුයි.

## 29 අධ්‍යාපනයේ අරමුණු

ළමයෙක් ලබන අධ්‍යාපනය, ඒ ළමයාගේ හැකියාවන් වර්ධනය කරන්න ඕනේ.
ඒ වගේම අනිත් අයගේ අයිතින්වලටත් ගරු කරන්න, අනිත් අයගේ ආගම්, සංස්කෘතීන්වලට ගරු කරන්න, ළමයින්ට උගන්වන්න ඕනේ.
අධ්‍යාපනය තුළින් සාමකාමීව ජීවත් වෙන්න, පරිසරය ආරක්ෂා කරන්න ළමයින්ට මග පෙන්වන්න ඕනේ.

## 30 සුළු ජන කොටස් වලට අයිති ළමයින්ගේ සංස්කෘතිය, භාෂාව සහ ආගම

ළමයින්ට තමන්ගේම භාෂාව, සංස්කෘතිය සහ ආගම භාවිතා කරන්න අයිතියක් තියෙනවා.
උදා: ළමයා තමන්ගේ මව් භාෂාව කතා කරන රටක ජීවත් නොවුණත් , ඕනෙම රටකදී ඒක කතා කරන්න අයිතියක් තියෙනවා.



## 31 සෙල්ලම් කරන්න, නිදහසේ ඉන්න තියෙන අයිතිය

සෑම ළමයෙකුටම විවේකීව ඉන්න, සෙල්ලම් කරන්න, නටන්න, සිංදු කියන්න, චිත්‍ර අඳින්න, ලියන්න, කියවන්න අයිතියක් තියෙනවා.

## 32 හානිකර වැඩවලින් ආරක්ෂා වීම

ළමයින්ගේ අධ්‍යාපනයට, සෞඛ්‍යයට හෝ සංවර්ධනයට හානිකර වැඩවලින් ආරක්ෂා වෙන්න ළමයින්ට අයිතියක් ඇත. ශ්‍රී ලංකාවේ අවුරුදු 16ට අඩු නම් දරුවන් වැඩකරන්න යොදාගන්න එක නීති විරෝධියි. ලංකාවේ අවු 16 - 18ත් අතර ළමයෙක් වැඩ කරන්නේ නම්, ඔවුන්ට ආරක්ෂිතව ඉන්න, සාධාරණ වැටුපක් ලබන්න අයිතියක් තියෙනවා.

## 33 හානිකර මත්ද්‍රව්‍යවලින් ආරක්ෂා වීම

හානිකර මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්න, හදන්න, ප්‍රවාහනයට හෝ විකිණීමට පාවිච්චි වීමෙන් ළමයින් ආරක්ෂා කිරීම රජයේ වගකීමක්.

## 34 ලිංගික අපයෝජනයෙන් ආරක්ෂා වීම

රජයන්, ළමයින් ඕනෑම ආකාරයේ ලිංගික සූරාකෑමකින් (ලිංගික ප්‍රයෝජන ලබා ගැනීම) හා ලිංගික අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරන්න ඕනේ. මුදල් ලබාදී ළමයින්ට ලිංගිකව හැසිරීමට බල කරන පුද්ගලයින් සහ ළමයින් යොදා ලිංගික පින්තූර හෝ චිත්‍රපට සෑදීමත් මේකට ඇතුළත්.

## 35 විකිණීමෙන් සහ මිනිස් වෙළඳාමෙන් ආරක්ෂා වීම

රජයන් විසින් ළමයින් පැහැරගෙන යාම්වලින්, විකිණීමෙන් සහ මිනිස් වෙළඳාමෙන් (රට තුළ හෝ ඉන් පිටත) ආරක්ෂා කළ යුතුයි.

## 36 සූරාකෑම් වලින් ආරක්ෂා වීම

මෙහි සඳහන් නොවන අනෙකුත් සියලු ආකාරයේ සූරාකෑම්වලින් (ළමයින්ගෙන් අයුතු ප්‍රයෝජන ලබා ගැනීමෙන්) ආරක්ෂා වීමට ද ළමයින්ට අයිතියක් තියෙනවා.

## 37 රැඳවුම් භාරයේ සිටින ළමයින්



නීතිය කඩ කළ බවට චෝදනා එල්ල වන ළමයින් මරා දැමීම, වධහිංසා පැමිණවීම, කෲර ලෙස සැලකීම, සදහටම සිරගත කිරීම හෝ වැඩිහිටියන් සමග සිරගත කිරීම නොකළ යුතුය.
ළමයෙකු රැඳවුම්භාරයේ නිවාසගත කළ යුත්තේ අවසාන පියවර ලෙසට, සහ කෙටිම කාලයක් සඳහා පමණයි.
මෙවන් ළමයින්ට නීතිමය සහාය ලැබීමට අයිතියක් ඇති අතර ඔවුන්ගේ පවුලේ අය සමග සම්බන්ධතා පවත්වා ගැනීමට හැකි විය යුතුය.

## 38 යුද්ධයේදී ආරක්ෂාව

යුද්ධයක් අතරතුර ළමයින්ට ආරක්ෂාව ලැබීමේ අයිතිය තියෙනවා. වයස අවුරුදු 15 ට අඩු කිසිම ළමයෙකු හමුදාවට බඳවාගැනීමට හෝ ගැටුමකට සහභාගී කරවන්න බෑ.

## 39 යුද්ධයට මුහුණදුන් ළමයින් සමාජගත කිරීම

ළමයෙක් යුද්ධයෙන් තුවාල වී, නොසලකා හැර, නරක ලෙස සැලකුම් ලබා හෝ නරක බලපෑම්වලට ලක් වූ විට, ඔවුන්ට ඉන් මිදීමට, සෞඛ්‍යසම්පන්නව, ගරුත්වයෙන් යුතුව ජීවත්වීමට උපකාර ලබා ගැනීමට අයිතියක් තියෙනවා.

## 40 නීතිය කඩ කරන ළමයින්

නීතිය කඩ කළ බවට චෝදනා ලැබූ දරුවන්ට නීතිමය සහාය සහ සාධාරණ සැලකිලි ලැබීමට අයිතියක් තියෙනවා.
මේ දරුවන්ට නැවත හොඳ පුරවැසියන් ලෙස සමාජගත වෙන්න අවශ්‍ය උපකාර වගේම විසඳුම් ලබාදෙන්න ඕනේ. සිරගත කිරීම සිදුකළ යුත්තේ අවසන් පියවරක් වශයෙන් පමණයි.

## 41 ළමුන් සඳහා හොඳම නීතිය අදාළ වේ

රටක නීති මෙම සම්මුතියට වඩා හොඳින් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ නම්, ළමා ආරක්ෂාව සඳහා එම නීති භාවිතා කළ යුතුය.

## 42 සෑම කෙනෙකුම ළමා අයිතිවාසිකම් දැන සිටිය යුතුය

ළමා අයිතිවාසිකම් ගැන සෑම කෙනෙකුම දැනගත යුතු අතර, රජයන් මෙම අයිතීන් ගැන ළමයින් සහ වැඩිහිටියන් දැනුවත් කරන්න ඕනේ.

## 43 සිට 54 දක්වා - සම්මුතිය ක්‍රියාත්මක වන ආකාරය

මේ තුළින් රජයන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටු සහ යුනිසෙෆ් ඇතුළු අනෙකුත් සංවිධාන සියලුම ළමයින්ට ඔවුන්ගේ සියලු අයිතිවාසිකම් භුක්ති විඳීම සහතික කිරීම සඳහා ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරයි.



At UNICEF we believe that every child whoever she is, wherever he lives deserves a childhood, a future, a fair chance.

That's why UNICEF has been there for every child in Sri Lanka day in day out since the 1950s.

For every child, education
For every child, health
For every child, protection
For every child, nutrition
For every child, opportunity

UNICEF Sri Lanka
UN Compound
202-204,
Bauddhaloka Mawatha,
Colombo 07, Sri Lanka.
colombo@unicef.org.



Ministry of Justice
Funded by the European Union
UNDP
unicef for every child
JURE
යුක්තිය සඳහා සහාය ව්‍යාපෘතිය
நீதித்துறைக்கான அனுசரணை திட்டம்
Support to Justice Sector Project
dpccs
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority


1
-18
DEFINITION OF A CHILD
2
NO DISCRIMINATION
3
BEST INTERESTS OF THE CHILD
4
MAKING RIGHTS REAL
5
FAMILY GUIDANCE AS CHILDREN DEVELOP
11
PROTECTION FROM KIDNAPPING
12
RESPECT FOR CHILDREN'S VIEWS
13
SHARING THOUGHTS FREELY
14
FREEDOM OF THOUGHT AND RELIGION
15
SETTING UP OR JOINING GROUPS
21
CHILDREN WHO ARE ADOPTED
22
REFUGEE CHILDREN
23
CHILDREN WITH DISABILITIES
24
HEALTH, WATER, FOOD, ENVIRONMENT
25
REVIEW OF A CHILD'S PLACEMENT
31
REST, PLAY, CULTURE, ARTS
32
PROTECTION FROM HARMFUL WORK
33
PROTECTION FROM HARMFUL DRUGS
34
PROTECTION FROM SEXUAL ABUSE
35
PREVENTION OF SALE AND TRAFFICKING
41
BEST LAW FOR CHILDREN APPLIES
42
EVERYONE MUST KNOW CHILDREN'S RIGHTS
43-54
HOW THE CONVENTION WORKS




# CONVENTION ON THE RIGHTS OF THE CHILD